# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 13 දරන පිතකොමිස් කිරීම් සහ පරම්පරාගත කිරීම් ආලෝපනය කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 13 දරන පිතකොමිස් කිරීම් සහ පරම්පරාගත කිරීම් ආලෝපනය කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1972 දෙසැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 59/72.

1972 අංක 20 දරන පිතකොමිස් කිරීම් සහ පරම්පරාගත කිරීම් ආලෝපනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජන රජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 13 දරන පිතකොමිස් කිරීම් සහ පරම්පරාගත කිරීම් ආලෝපනය කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1972 අංක 20 දරන පිතකොමිස් කිරීම් සහ පරම්පරාගත කිරීම් ආලෝපනය කිරීමේ පනතෙහි 10 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 1972 අංක 20 දරන පනතේ 10 වන වගන්තිය වෙනුවට අනෙකක් යෙදීම.

"පරම්පරාගත කිරීමේ සහ ප්‍රදානය කිරීමේ ආඥාපනත අවලංගු කිරීම සහ ණය මණ්ඩලයෙහි හා ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජිත මුදල් ගෙවනු ලැබීම.

10. (1) පරම්පරාගත කිරීමේ සහ ප්‍රදානය කිරීමේ ආඥාපනත මෙයින් අවලංගු කරනු ලැබේ.

(2) (අ) පරම්පරාගත කිරීමේ සහ ප්‍රදානය කිරීමේ ආඥාපනතෙහි 7 වන වගන්තියේ විධිවිධාන අනුව මුදල් කිසිවක් මේ පනත ආරම්භ වන දිනයේ දී ණය මණ්ඩලයෙහි ආයෝජනය කරනු ලැබ තිබෙන අවස්ථාවක, මේ පනතේ විධිවිධානවල හෝ මේ පනතේ 8 වන වගන්තිය යටතේ ලියා අත්සන් කර දෙන ලද යම් පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඒ මුදල්වලට හිමිකම් ඇත්තා වූ හෝ හිමිකම් ලබන්නා වූ යම් තැනැත්තකු විසින් ඒ මුදල තමා වෙත ගෙවන ලෙසට වූ ආඥාවක් අධිකරණයෙන් ඉල්ලා සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන නො තකා කළ හැකි ය.

(ආ) (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත් ව, (අ) ඡේදය යටතේ ඉල්ලීමක් කරනු ලැබූ විට ණය මණ්ඩලයෙහි ආයෝජිත මුදල් ගෙවනු ලැබීම සඳහා වූ ආඥාවක් අධිකරණයක් විසින් කරනු ලබන අවස්ථාවක, පරම්පරාගත කිරීමේ එක් එක් නඩුව සම්බන්ධයෙන්, ඒ නඩුව පිළිබඳව එසේ ගෙවන ලෙස අණ කරනු ලැබූ මුදල ණය මණ්ඩලය විසින් පහත දැක්වෙන ආකාරයෙන් ගෙවිය යුතු ය :—

(i) ඒ නඩුව සම්බන්ධයෙන් ණය මණ්ඩලයෙහි ආයෝජිත සම්පූර්ණ මුදල රුපියල් එක් ලක්ෂයකට වැඩි නො වන අවස්ථාවක, ඒ පරම්පරාගත කිරීමේ නඩුව සම්බන්ධයෙන්, (මෙහි මින් මතු "අදාළ දිනය"

1*—කේ 17507—10,114 (72/10)

සනුවෙන් සඳහන් කරනු ලබන) පළමු වන ගෙවීම් ආඥවේ දින සිට අවුරුද්දක් ඇතුළත, ඒ සම්පූර්ණ මුදල,

(ii) ඒ නඩුව සම්බන්ධයෙන් ණය මණ්ඩලයෙහි ආයෝජිත සම්පූර්ණ මුදල රුපියල් එක් ලක්ෂයකට වැඩි වන, එහෙත් රුපියල් දෙලක්ෂයකට වැඩි නො වන අවස්ථාවක, අදාළ දින සිට අවුරුද්දක් ඇතුළත පළමු වන රුපියල් එක් ලක්ෂය සහ අදාළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත එහි ඉතිරි මුදල,

(iii) ඒ නඩුව සම්බන්ධයෙන් ණය මණ්ඩලයෙහි ආයෝජිත සම්පූර්ණ මුදල රුපියල් දෙලක්ෂයකට වැඩි වන, එහෙත් රුපියල් හාර ලක්ෂයකට වැඩි නො වන අවස්ථාවක, අදාළ දින සිට අවුරුද්දක් ඇතුළත පළමුවන රුපියල් ලක්ෂය, අදාළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත දෙවන රුපියල් ලක්ෂය සහ අදාළ දින සිට අවුරුදු තුනක් ඇතුළත එහි ඉතිරි මුදල, සහ

(iv) ඒ නඩුව සම්බන්ධයෙන් ණය මණ්ඩලයෙහි ආයෝජිත සම්පූර්ණ මුදල රුපියල් හාර ලක්ෂයකට වැඩි වන අවස්ථාවක, අදාළ දින සිට අවුරුද්දක් ඇතුළත පළමුවන රුපියල් ලක්ෂය, අදාළ දින සිට අවුරුදු දෙකක් ඇතුළත දෙවන රුපියල් ලක්ෂය, අදාළ දින සිට අවුරුදු තුනක් ඇතුළත ඊළඟ රුපියල් දෙලක්ෂය සහ අදාළ දින සිට අවුරුදු හතරක් ඇතුළත එහි ඉතිරි මුදල.

(ඇ) පරම්පරාගත කිරීමේ සහ ප්‍රදානය කිරීමේ ආඥාපනතෙහි 7 වන වගන්තියේ විධිවිධාන අනුව මුදල් කිසිවක් මේ පනත ආරම්භ වීමේ දින ආණ්ඩුවේ සුරැකුම් පත්වල ආයෝජනය කරනු ලැබ තිබෙන අවස්ථාවක, මේ පනතේ විධිවිධානවල හෝ මේ පනතේ 8 වන වගන්තිය යටතේ ලියා අත්සන් කර දෙන ලද යම් පැවරීමක ප්‍රතිඵලයක් වශයෙන් ඒ සුරැකුම්පත්වලට හිමිකම් ඇත්තා වූ හෝ හිමිකම් ලබන්නා වූ යම් තැනැත්තකු විසින් ඒ සුරැකුම් පත් තමා වෙත පවරන ලෙසට වූ ආදෙවක් අධිකරණයෙන් ඉල්ලා සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන නො තකා කළ හැකි ය.

(ඇ) මේ වගන්තිය යටතේ අධිකරණයක් විසින් ගෙවීම් ආඥාවක් හෝ පැවරුම් ආඥාවක් කරනු ලැබීමට පෙර, ඉල්ලුම්කරු විසින් කරන ලද ඉල්ලීමට අධිකරණය විසින් සෑහේ යයි සිතනු ලබන ආකාරයේ ප්‍රසිද්ධියක් අධිකරණය විසින් ලබා දිය යුතු අතර ඒ ප්‍රසිද්ධ කිරීම හේතුකොට ගෙන ඒ අධිකරණය ඉදිරියට පැමිණිය හැකි සියලු තැනැත්තන්ට සවන් දීමෙන් පසුව පමණක් අධිකරණය විසින් ස්වකීය ගෙවීම් ආඥාව හෝ පැවරුම් ආඥාව කළ යුතු ය. ඉල්ලුම්කරු විසින් ඒ ප්‍රසිද්ධ කිරීමේ වියදම් දැරිය යුතු ය.

(ඉ) (i) යම් ලිඛිත නීතියක් යටතේ ඉල්ලුම්කරුගෙන් මෙහි මින් මතු "කොමසාරිස්" යනුවෙන් සඳහන් කරනු ලබන දේශීය ආදායම් කොමසාරිස්ට යම් මුදල් ප්‍රමාණයක් අය විය යුතු හෝ අය විය යුතු විය හැකි ද නැද්ද යන බව සහ යම් මුදලක් අය විය යුතු හෝ අය විය යුතු විය හැකි නම් ඒ මුදලේ ප්‍රමාණය ප්‍රකාශ කෙරෙන සහතිකයක් ඒ කොමසාරිස්ගෙන් ලබා ගෙන ඒ ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන තුරු අධිකරණය විසින් (ආ) ඡේදය යටතේ වූ ගෙවීම් ආඥාවක් නො කළ යුතු ය.

(ii) ඉල්ලුම්කරුගෙන් කිසිම මුදල් ප්‍රමාණයක් කොමසාරිස්ට අය විය යුතුව නො තිබෙන බව ඒ සහතිකයෙන් ප්‍රකාශ වන අවස්ථාවක, අධිකරණය විසින් (ආ) ඡේදයෙහි දැක්වෙන ආකාරයෙන් ගෙවීම් ආඥාවක් ඉල්ලුම්කරු නමට නිකුත් කළ යුතු ය.

(iii) ඉල්ලුම්කරුගෙන් යම් මුදලක් කොමසාරිස්ට අය විය යුතු බව ඒ සහතිකයෙන් ප්‍රකාශ වන අවස්ථාවක, ණය මණ්ඩලය විසින් කොමසාරිස්ට ඒ මුදල ගෙවිය යුතු බවට ද ඉතිරි මුදල (ආ) ඡේදයෙහි දැක්වෙන ආකාරයෙන් ඉල්ලුම්කරුට ගෙවන ලෙසට ද වූ ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය.

(iv) ඉල්ලුම්කරුගෙන් යම් මුදලක් කොමසාරිස්ට අය විය යුතු විය හැකි බව ඒ සහතිකයෙන් ප්‍රකාශ වන අවස්ථාවක, ණය මණ්ඩලය විසින් ඒ මුදල ඒ පරම්පරාගත කිරීමේ නඩුවෙහි බැරට

අධිකරණයෙහි තැන්පත් කොට ඉතිරි මුදල (ආ) ඡේදයෙහි දැක්වෙන ආකාරයෙන් ඉල්ලුම්කරුට ගෙවන ලෙසට වූ ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය. ඉල්ලුම්කරුගෙන් කොමසාරිස්ට අය විය යුතු මුදලේ අවසාන නිශ්චය අධිකරණයට දැනුම් දෙනු ලැබීමෙන් පසුව අධිකරණය විසින් ඒ මුදල කොමසාරිස්ට ගෙවා ඉතිරි මුදල (ආ) ඡේදයෙහි දැක්වෙන ආකාරයෙන් ඉල්ලුම්කරුට ගෙවිය යුතු ය.

(v) මේ ඡේදය යටතේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් කොමසාරිස් නො කැඳවා අධිකරණයට ඉදිරිපත් කළ හැකි අතර ඒ සහතිකය එහි අඩංගු ප්‍රකාශවල සත්‍යතාවය පිළිබඳ මූල් බැල්මට පෙනෙන සාක්ෂ්‍යය විය යුතු ය.".

මේ පනත අතීතයට ද බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියෙහි කරන ලද සංශෝධනය ඒ ප්‍රධාන ප්‍රඥප්තිය ආරම්භවීමේ දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.